	2019 අවසන් ගිණුම් වාර්තාව අනුව ඉවත් කරන ලද අගය					
3	කාර්යාලීය උපකරණ	1,400,817.17	3,354,012.36	4,325,291.86	1,079,657.57	
4	පිරියත හා යන්ත්‍රෝපකරණ	-	97,761.65	-	-	
5	විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ	3,528,646.54	3,391,523.36	8,506,653.38	-	
6	ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	559,607.64	2,181,168.53	483,954.09	76,267.66	
7	පොත්පත් හා වාර සඟරා	960	4,750.36	45,619.54	11,411.51	
8	මෝටර් වාහන	81,000.00	-	-	-	
14	උපාධි ලෝගු සහ ඇඳුම් ආධිත්තම්	295,298.64	313,116.00	-	-	
	අ	**5,866,329.99**	**9,342,332.26**	**13,361,518.87**	**1,167,336.74**	
	2020 අවසන් ගිණුම් වාර්තාව අනුව ඉවත් කරන ලද අගය (ස්ථාවර වත්කම් පැහැර්ජය ගැලපීමෙන් පසුව)					
3	කාර්යාලීය උපකරණ	1,420,429.77	3,370,233.10	4,602,189.49	1,122,191.28	
4	පිරියත හා යන්ත්‍රෝපකරණ	-	111,212.65	-	-	
5	විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ	3,546,167.71	3,472,582.47	8,533,904.88	-	
6	ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	697,386.22	2,359,847.48	540,455.97	82,674.10	
7	පොත්පත් හා වාර සඟරා	960	11,845.36	66,211.54	20,311.51	
8	මෝටර් වාහන	81,000.00	-	-	-	
14	උපාධි ලෝගු සහ ඇඳුම් ආධිත්තම්	360,000.00	313,116.00	-	-	
	ආ	**6,105,943.70**	**9,638,837.06**	**13,742,761.88**	**1,225,176.89**	
	ඌණ වටිණාකම					
3	කාර්යාලීය උපකරණ	19,612.60	16,220.74	276,897.63	42,533.71	**355,264.68**
4	පිරියත හා යන්ත්‍රෝපකරණ	-	13,451.00	-	-	**13,451.00**
5	විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ	17,521.17	81,059.11	27,251.50	-	**125,831.78**
6	ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	137,778.58	178,678.95	56,501.88	6,406.44	**379,365.85**
7	පොත්පත් හා වාර සඟරා	-	7,095.00	20,592.00	8,900.00	**36,587.00**
8	මෝටර් වාහන	-	-	-	-	**-**
14	උපාධි ලෝගු සහ ඇඳුම් ආධිත්තම්	64,701.36	-	-	-	**64,701.36**
	අ - ආ	**239,613.71**	**296,504.80**	**381,243.01**	**57,840.15**	**975,201.67**

ඔ. මෙම සභරා 2018 වර්ෂයේදී අදාළ සැපයුම්කරුට කලින් මුදල් ගෙවා ඇණවුම් කරන ලදී. එම සභරාවලින් කොටසක් ලැබී නිබූ අතර ඉතිරිය වෙනුවෙන් 2019 වර්ෂය තුළ රු. 44,500.00 ක් සඳහා වූ චෙක්පතක් ලැබුණි. පසුව චෙක්පත අගරු වූ අතර එය විශ්වවිද්‍යාලය වෙත ලැබිය යුතු ලෙස සැලකේ.

ඕ. පෙර වාර්තා කරන ලද වෙනත් ගෙවිය යුතු දේ රු. 53,621,965.35 ක් වූ අතර එහි යලි ප්‍රකාශිත අගය රු. 53,721,965.35 කි. කාර්යාලීය උපකරණ යටතේ ඇතුළත් කර නිබූ ස්ථාවර වත්කම් අංක 10101/01-03/ POE/00001 දරන POE ස්විචයේ රු. 171,925.00 වූ පිරිවැය එය මිලට ගත් 2019 වර්ෂයේදී රු. 100,000.00 කින් උණ ප්‍රකාශිතව නිබුණි. එම වත්කමෙහි උණ වටිණාකම වූ රු. 100,000.00 හා ක්ෂය සඳහා උණ ප්‍රතිපාදනය වූ රු. 547.95 2019 වර්ෂයේ ගිණුම් පොත් තුළ ගැලපුම් කොට 2020 වර්ෂය සඳහා වූ අවසාන ගිණුම්වල පුනර්-ප්‍රකාශ කරන ලදී.

ක. පෙර වාර්තා කරන ලද තැන්පත් හා රැඳවුම් රු. 8,639,418.24 ක් වූ අතර එහි යලි ප්‍රකාශිත අගය රු. 88,439,418.24 කි. ඒ අනුව වෙනස රු. 1,200,000.00 කි. නේවාසිකාගාර ගොඩනැගිල්ල සඳහා වූ රැඳවුම් මුදල වූ රු. 1,200,000.00 2011 වර්ෂයේ නේවාසිකාගාර සඳහා ගෙවනලද කුලිය ලෙස ගිණුම් ගත කර නිබුණි ඒ අනුව සමුච්චිත අරමුදල රු. 1,200,000.00 කින් වැඩි වී ඇත.

ග. පෙර වාර්තා කරන ලද (විශේෂිත) අරමුදල රු. 17,236,292.61 ක් වූ අතර එහි යලි-ප්‍රකාශිත වටිණාකම රු. 17,680,868.41 කි. එහි වෙනස වන්නේ ගිවිසුම් කඩකිරීමේ අරමුදලේ පොළියයි. ගිවිසුම් කඩකිරීමේ අරමුදල 2016 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කොල්ලුපිටිය ශාඛාවෙහි ආයෝජනය කරන ලදී. 2016, 2017 හා 2018 වර්ෂවල ලැබුණු පොළිය රු. 444,575.80 ක් වූ අතර එය පොළී ආදායමක් වශයෙන් සටහන් කොට, අවසානයේදී පොදු සංචිත තුළ සමුච්චයනය කරන ලදුව ගිවිසුම් කඩකිරීමේ අරමුදලට මාරුකරන ලදී.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

03-08 පුනරාවර්තන වියදමෙහි සාරාංශය - 2020

Rs.

සටහන : 3.01

වැය විෂය ශීර්ෂය	වැඩසටහන 1	වැඩසටහන 2	වැඩසටහන 3	වැඩසටහන 4	වැඩසටහන 5	වැඩසටහන 8	එකතුව
	පරිපාලන	අධ්‍යයන කටයුතු	පුස්තකාල සේවා	ශිෂ්‍ය සුබසාධන	නඩත්තු	නේවාසිකාගාර	
පුද්ගල පඩිනඩි - අධ්‍යයන කාර්ය මණ්ඩලය							
04101 වැටුප් හා වේතන	13,176,521	165,694,450	4,713,890	1,374,648	-	-	184,959,508
04102 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	1,847,192	39,468,689	1,223,541	287,959	-	-	42,827,382
04103 විශ්‍රාම වැටුප	1,431,892	18,207,793	608,865	-	-	-	20,248,550
04104 සේවක භාරකාර අරමුදල	646,472	11,565,464	366,481	57,592	-	-	12,636,008
04105 වැඩබැලීමේ දීමනාව	-	194,000	-	79,416	-	-	273,416
04108 අධ්‍යයන දීමනාව	8,226,023	194,865,764	7,129,024	-	-	-	210,220,811
04110 වෙනත් දීමනා	67,258	643,040	-	21,839	-	45,855	777,992
04111 ආගිය කථිකාචාර්ය ගාස්තුව	140,500	20,415,333	-	736,250	-	-	21,292,083
04113 ජීවන වියදම් දීමනාව	1,328,717	16,747,061	374,400	205,140	-	-	18,655,318
04116 20% දීමනාව (5%+15%)	19,570	-	-	-	-	-	19,570
04118 පර්යේෂණ දීමනාව	1,860,764	43,425,027	1,649,416	-	-	-	46,935,207
04119 20% අමතර දීමනාව	1,615,902	30,839,869	942,523	156,744	-	-	33,555,039
04121 MCA දීමනාව (නව)	1,046,253	8,710,083	-	352,674	-	-	10,109,010
04123 ගැලපුම් දීමනාව	-	1,395	-	-	-	-	1,395
04124 සංග්‍රහ දීමනාව	571,518	2,904,888	220,471	-	-	-	3,696,877
04125 ප්‍රවාහන දීමනාව	-	2,204,839	600,000	-	-	-	2,804,839
04126 ඉන්ධන දීමනාව	-	776,354	184,800	-	-	-	961,154
	31,978,583	**556,664,049**	**18,013,410**	**3,272,262**	**-**	**45,855**	**609,974,159**
පුද්ගල පඩිනඩි - අනධ්‍යයන කාර්ය මණ්ඩලය							
04201 වැටුප් හා වේතන	51,003,770	40,778,546	5,452,309	10,781,372	9,623,577	1,103,105	118,742,680
04202 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	6,965,623	5,615,603	704,799	1,365,907	1,553,545	125,063	16,330,540
04203 විශ්‍රාම වැටුප	5,475,700	4,341,142	668,834	1,284,262	878,475	142,930	12,791,343
04204 සේවක භාරකාර අරමුදල	2,488,266	1,991,524	274,727	530,034	486,524	53,599	5,824,674
04205 වැඩබැලීමේ දීමනාව	523,078	97,078	-	-	198,540	-	818,696
04208 අතිකාල	1,712,086	1,753,225	168,295	151,820	334,696	-	4,120,123
04209 නිවාඩු දින ගෙවීම්	128,701	8,306	-	2,834	-	-	139,841
04210 වෙනත් දීමනා	97,150	40,947	4,200	493,693	6,300	79,999	722,288
04213 ජීවන වියදම් දීමනාව	9,519,228	8,489,516	1,252,277	2,035,800	2,160,600	187,200	23,644,621
04216 20% දීමනාව (5%+15%)	-	-	-	-	-	-	-
04218 පර්යේෂණ දීමනාව	4,410,299	1,521	-	749,802	511,636	-	5,673,258
04219 20% අතිරේක මාසික දීමනාව	10,132,530	7,720,499	1,090,383	2,156,137	1,939,544	220,610	23,259,703
04221 මාසික අලාභ පියවීමේ දීමනාව (නව)	22,807,376	17,369,767	2,453,361	4,851,308	4,363,457	496,372	52,341,641
04223 ගැලපුම් දීමනාව	3,833	232	-	-	-	-	4,065
04224 සංග්‍රහ දීමනාව	524,328	104,827	-	136,838	-	-	765,992
04225 ප්‍රවාහන දීමනාව	1,200,000	-	-	-	-	-	1,200,000
04226 ඉන්ධන දීමනාව	430,080	-	-	-	-	-	430,080
	117,422,049	**88,312,733**	**12,069,186**	**24,692,806**	**22,056,894**	**2,408,878**	**266,962,546**
							876,936,705
සටහන : 3.02							
ගමන් වියදම්							
0501 දේශීය	10,775	60,040	741	100	4,440	5,130	81,226
0502 විදේශීය	-	200,000	-	-	-	-	200,000
	10,775	**260,040**	**741**	**100**	**4,440**	**5,130**	**281,226**
සටහන :04							
සැපයුම්							
0601 ලිපිද්‍රව්‍ය	2,349,908	1,938,340	83,525	456,328	47,990	55,540	4,931,631
0602 ඉන්ධන	1,430,301	5,500	-	-	3,720	5,280	1,444,801
0603 නිල ඇඳුම්	136,347	28,170	-	4,721	144,450	-	313,687
0604 යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ	396,386	226,504	-	19,960	1,656,622	47,156	2,346,628
0605 රසායනික හා විදුරු භාණ්ඩ	960	149,170	-	-	507,572	-	657,702
0606 වෛද්‍ය සැපයුම්	154,110	213,020	7,580	468,479	789,492	2,850	1,635,531
0607 වෙනත් සැපයුම්	168,229	1,788,269	373	63,872	193,879	91,386	2,306,008
	4,636,242	**4,348,973**	**91,477**	**1,013,360**	**3,343,725**	**202,212**	**13,635,989**
සටහන : 05							
සුළු අළුත්වැඩිය හා නඩත්තු							
0701 වාහන	776,038	-	-	-	-	-	776,038
0702 පිරියත හා යන්ත්‍රෝපකරණ	3,185,045	2,839,212	15,183	111,107	650	1,731,473	7,882,669
0703 ගොඩනැගිලි	424,412	390,935	-	-	59,196	114,352	988,895
0704 ගෘහ භාණ්ඩ	-	970	-	-	-	-	970
0705 වෙනත්	-	-	-	-	-	-	-
	4,385,494	**3,231,117**	**15,183**	**111,107**	**59,846**	**1,845,824**	**9,648,571**

සටහන : 06							
ගිවිසුම්ගත සේවා							
0801	ප්‍රවාහනය	-	-	-	4,000	-	-	4,000
0802	විදුලි සංදේශ	13,216,722	9,291,641	34,624	59,351	23,125	84,283	22,709,746
0803	තැපැල් ගාස්තු	295,985	60,510	-	165,515	-	-	522,010
0804	විදුලිය	7,858,526	2,343,646	-	-	-	4,838,885	15,041,057
0805	ආරක්ෂක සේවය	9,993,725	11,268,462	-	-	-	12,863,155	34,125,342
0806	ජලය	988,765	404,179	-	-	-	2,295,744	3,688,688
0807	පිරිසිදු කිරීමේ සේවය	7,405,583	10,461,170	-	5,035	-	9,284,783	27,156,571
0808	කුලී හා කුලී ගාස්තු	3,105,453	-	-	1,000	-	-	3,106,453
0809	පළාත් පාලන ආයතනය වෙත වරිපනම් හා බදු	660,789	-	-	150	-	-	660,939
0810	මුද්‍රණ හා ප්‍රචාරණ කටයුතු	68,619	291,513	1,200	67,770	816	-	429,918
0811	වෙනත්	51,711	285,743	-	-	-	253,800	591,254
		43,645,878	**34,406,863**	**35,824**	**302,821**	**23,941**	**29,620,650**	**108,035,977**
සටහන : 07								
වෙනත් පුනරාවර්තන වියදම්								
0901	ආචාර්යවරුන් සඳහා ගමන් වියදම් දීමනා	-	-	-	-	-	-	-
0902	විශේෂ සේවය - පාලක සභාව හා කමිටු	682,498	205,300	-	4,500	-	-	892,298
0903	විශේෂ සේවය - වෘත්තීය හා වෙනත්	4,538,302	12,965	-	-	-	-	4,551,267
0904	වැඩමුළු හා සම්මන්ත්‍රණ	26,495	291,733	-	-	-	-	318,228
0905	අධ්‍යයන පර්යේෂණ	-	-	-	-	-	-	-
0906	කාර්යමණ්ඩල සංවර්ධනය	586,280	327,500	15,000	50,000	-	-	978,780
0907	පශ්චාත් උපාධි පර්යේෂණ හා ශිෂ්‍යත්ව	450,000	-	-	-	-	-	450,000
0908	ශිෂ්‍යයන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය	(2,000)	132,000	-	-	-	-	130,000
0909	ප්‍රායෝගික ක්ෂේත්‍ර අධ්‍යයන	220,575	152,313	-	-	-	-	372,888
0910	ශිෂ්‍ය සංවර්ධන මූලිකත්වයන්	-	598,944	-	-	-	-	598,944
0911	විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම්	-	-	-	14,400	-	-	14,400
0912	ශිෂ්‍ය සුභසාධනය	-	-	-	-	-	-	-
0913	සංයුක්ත සැලසුම්කරණය	-	-	-	-	-	-	-
0914	වෙනත් සංවිධාන වෙත ප්‍රදානයන්	-	-	-	-	-	-	-
0915	නිදහස් ගමන් බලපත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර	634044	700385	60190	54275	188525	51942	1,689,361
0916	සංග්‍රහ වියදම්	460,655	247,365	21,545	12,305	5,000	-	746,870
0917	බැංකු ගාස්තු	89,554	-	-	-	-	-	89,554
0918	ප්‍රදානයන්	5,000	-	-	-	-	-	5,000
0919	සාමාජික ගාස්තු	290,096	3,050	-	150,000	5,667	-	448,813
0920	උපාධි ප්‍රදානෝත්සවය	-	-	-	-	-	-	-
0921	විභාග වියදම්	-	3,333,529	-	-	-	-	3,333,529
0922	පුවත්පත් හා සඟරා	1,256,194	33,672	265	65,932	9,050	129,435	1,494,548
0923	දේපළ ණය සඳහා පොළිය	-	-	-	-	-	-	-
0924	රක්ෂණය	-	-	-	-	-	-	-
0925	පශ්චාත් උපාධි	-	-	-	-	-	-	-
0926	සේවක සුභසාධනය හා වෛද්‍ය රක්ෂණය	9,721,354	-	-	-	-	-	9,721,354
								-
		18,959,047	**6,038,756**	**97,000**	**351,412**	**208,242**	**181,377**	**25,835,835**
		221,038,068	**693,262,531**	**30,322,821**	**29,743,868**	**25,697,089**	**34,309,926**	**1,034,374,302**
සටහන : 08								
ශිෂ්‍යාධාර			**10,215,700**					10,215,700
								1,044,590,002

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

9 ව්‍යාපෘති හා වැඩසටහන් අනුව වියදම

	රු. ව්‍යාපෘතිය	රු. වැඩසටහන
සාමාන්‍ය පාලනය		
සාමාන්‍ය පාලනය	176,914,807	
මූල්‍යය	33,376,217	
ආරක්ෂක	10,742,512	**221,033,536**
අධ්‍යයන සේවා		
දෘශ්‍ය කලා	182,362,543	
නර්තන හා නාට්‍ය කලා	270,460,049	
සංගීත	220,602,621	
විභාග	10,665,688	
පශ්චාත් උපාධි	9,183,700	**693,274,601**
ඉගැන්වීමේ සම්පත්		
පුස්තකාලය	30,322,821	**30,322,821**
සුභසාධක සේවා		
සෞඛ්‍යය	7,301,564	
ශාරීරික අධ්‍යාපනය	4,482,145	
ශිෂ්‍ය සේවා	17,952,620	**29,736,329**
ඉඩම් හා ගොඩනැගිලි නඩත්තුව		
නඩත්තුව	25,697,089	**25,697,089**
ශිෂ්‍ය නේවාසිකාගාර		
නේවාසිකාගාර	34,309,926	**34,309,926**
මුළු වියදම		**1,034,374,302**
වෙනත් වියදම්		-
මහපොල/ශිෂ්‍යාධාර		10,215,700
		10,215,700
		1,044,590,002

10 දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ

රු.

	ඉඩම	ගොඩනැගිලි	විද්‍යාගාරය හා ඉගැන්වීම උපකරණ	ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	පුස්තකාල ග්‍රන්ථ හා වාර සඟරා	මෝටර් වාහන	පිරියත හා යන්ත්‍රෝපකරණ	උපාධි ලෝගු සහ වස්ත්‍රාභරණ	කාර්යාලීය උපකරණ	ක්‍රීඩා භාණ්ඩ	එකතුව
පිරිවැය/ප්‍රත්‍යාගණනය											
2020 ජනවාරි 01 දිනට ශේෂය (යලි-ප්‍රකාශිත)	2,117,041,000	2,119,318,905	349,656,508	206,347,666	55,071,274	27,400,000	1,962,748	19,798,379	248,905,238	4,731,640	5,150,233,357
එකතු කිරීම්	-	31,651,892	2,298,063	677,292	559,940	11,580,089	-	-	8,801,185	-	55,568,461
බැහැර කිරීම්	-	-	(3,689,781)	(837,785)	-	-	(3,250)	-	(3,059,126)	-	(7,589,942)
ගැලපුම්	-	-	-	-	-	-	-	-	(714,167)	714,167	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,117,041,000**	**2,150,970,796**	**348,264,790**	**206,187,172**	**55,631,214**	**38,980,089**	**1,959,498**	**19,798,379**	**253,933,130**	**5,445,807**	**5,198,211,876**
ක්ෂය											
2020 ජනවාරි 01 දිනට ශේෂය (යලි-ප්‍රකාශිත)		430,851,065	270,517,135	102,610,566	47,275,879	10,960,000	1,887,918	16,047,395	146,482,837	2,051,248	1,028,684,043
වර්ෂය සඳහා ලියා හැරීම්		105,965,945	29,363,508	17,724,368	2,942,619	7,415,303	51,767	1,210,320	34,489,144	946,328	200,109,302
බැහැර කිරීම් සඳහා ඉවත් කිරීම්		-	(3,689,781)	(639,943)	-	-	(3,250)	-	(3,045,082)	-	(7,378,056)
ගැලපුම්		-	-	-	-	-	-	-	(714,167)	714,167	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		**536,817,010**	**296,190,862**	**119,694,991**	**50,218,498**	**18,375,303**	**1,936,435**	**17,257,715**	**177,212,732**	**3,711,743**	**1,221,415,289**
ධාරණ වටිනාකම්											
2020 දෙසැම්බර් 31 දිනට	**2,117,041,000**	**1,614,153,786**	**52,073,928**	**86,492,182**	**5,412,715**	**20,604,787**	**23,063**	**2,540,664**	**76,720,398**	**1,734,064**	**3,976,796,587**
2019 දෙසැම්බර් 31 දිනට (යලි-ප්‍රකාශිත)	**2,117,041,000**	**1,688,467,839**	**79,139,373**	**103,737,100**	**7,795,395**	**16,440,000**	**74,830**	**3,750,984**	**102,422,402**	**2,680,392**	**4,121,549,314**

11 අස්පෘශ්‍ය වත්කම්

රු.

පරිගණක මෘදුකාංග

අනු අංකය	මිලට ගත් දිනය	විස්තරය	පිරිවැය	ආරම්භයේදී සමුච්චිත ක්‍රමක්ෂය	වර්ෂය සඳහා ක්‍රමක්ෂය	අවසානයේදී සමුච්චිත ක්‍රමක්ෂය	ධාරණ වටිණාකම
1	2014 මාර්තු	ප්‍රධාන පුස්තකාල මෘදුකාංග	315,000	315,000	-	315,000	-
2	2015 නොවැම්බර්	ගිණුම්කරණ	136,000	113,333	22,667	136,000	-
3	2015 නොවැම්බර්	මූල්‍ය	24,000	20,000	4,000	24,000	-
4	2016 ජූනි	ස්ථාවර වත්කම් කළමනාකරණ මෘදුකාංගය	275,000	194,986	55,000	249,986	25,014
5	2018 ජූලි	මූල්‍ය	85,000	-	42,523	42,523	42,477
			835,000	**643,319**	**124,190**	**767,509**	**67,491**

12 මුදල් හා මුදල් සම දේ

	රු. 2020	රු. 2019
මුදල් පොත් ශේෂය		
ගිණුම් අංකය		
ජංගම ගිණුම 5276145 (පුනරාවර්තන ගිණුම)	280,565	642,275
ජංගම ගිණුම 5276143 (ප්‍රාග්ධන ගිණුම)	490,120	2,400,911
ජංගම ගිණුම 5276136 (ශිෂ්‍යාධාර ගිණුම)	2,741,067	1,785,067
ජංගම ගිණුම 810034 (පශ්චාත් උපාධි ගිණුම)	2,390,478	3,971,681
ජංගම ගිණුම 71876640 (විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන ගිණුම)	10,885,840	11,475,849
මහපොල	-	1,000,000
සුළු මුදල් අග්‍රිම	37,997	42,997
ලංකා බැංකුවේ රැස්කිරීමේ ගිණුම (84072227)	546,379	643,147
ඉතිරි කිරීමේ ගිණුම (පුනරාවර්තන) 86608218	76,741	-
ඉතිරි කිරීමේ ගිණුම (ප්‍රාග්ධන) 86608362	139,352	-
ඉතිරි කිරීමේ ගිණුම (මහපොල) 86608520	3,717	-
ඉතිරි කිරීමේ ගිණුම (රැස්කිරීම්) 86608388	6	-
	17,592,262	**21,961,927**

13 අයවිය යුතු දේ

	රු. 2020	රු. 2019
අයවිය යුතු ශිෂ්‍යත්ව අරමුදල් පොළිය	7,220	13,127
රක්ෂණ වාරිකය	32,727	-
දේපළවලින් අය විය යුතු කුලී	287,000	1,000
අයවිය යුතු ශිෂ්‍යාධාර	14,888,200	14,844,200
උපකුලපති අරමුදල් ආයෝජනය මත අයවිය යුතු පොළිය	7,070	8,471
අයවිය යුතු විදුලි වියදම්	495,000	290,857
විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ස්ථිර තැන්පතු මත අයවිය යුතු පොළිය	1,747,477	1,920,013
සුනිල් ශාන්ත අරමුදල මත අයවිය යුතු පොළිය	20,898	31,072
සුගුණසිරි අරමුදල මත අයවිය යුතු පොළිය	1,445	1,445
මහගමසේකර අරමුදල මත අයවිය යුතු පොළිය	482	482
අයවිය යුතු - කේ.එච්.ආර්.ටී. සමරවික්‍රම	361,084	-
අයවිය යුතු - කඩදාසි සංස්ථාව	2,364	-
	44,500	44,500
	17,895,465	**17,155,166**

14 තොග

	රු. 2020	රු. 2019
ගබඩා පාලන ගිණුම	6,283,635	6,123,561
	6,283,635	**6,123,561**

15	ඉදිරියට ගෙවීම්	රු. 2020	රු. 2019
	දුම්රිය නිදහස් ගමන් බලපත්‍ර	994,426	133,567
	උපයන විට ගෙවීමේ බදු	12,823	40,529
		1,007,249	**174,096**

16	අත්තිකාරම්	රු. 2020	රු. 2019
	තැපැල් අත්තිකාරම	55,725	230,790
	විවිධ අත්තිකාරම්	-	298,864
	අත්තිකාරම - පුස්තකාල සහරා	4,425	92,258
	එකතුව	**60,150**	**621,912**

17	ප්‍රාග්ධන අත්තිකාරම්	රු. 2020	රු. 2019
	නව ගොඩනැගිලි	170,054	4,290,874
	සංගීත පීය ගොඩනැගිල්ල (IV අදියර)	73,363	73,363
	ගොඩනැගිලි පුනරුත්ථාපනය	10,321	1,028,632
	හෝර්ටන් පෙදෙස නව ගොඩනැගිල්ල	26,294,278	55,518,212
	පොදු පහසුකම් ගොඩනැගිල්ල	35,073,667	70,027,583
		61,621,684	**130,938,664**

18 කාර්ය මණ්ඩලය සඳහා ණය/ අත්තිකාරම්	රු. 2020	රු. 2019
අර්ථසාධක අරමුදල් ණය ආශ්‍රිත අයවිය යුතු දේ	-	102,557
වැටුප් අත්තිකාරම්	3,000	43,275
විශේෂ අත්තිකාරම	38,580	57,680
උත්සව අත්තිකාරම්	234,090	311,090
ආපදා ණය	45,822,942	48,460,554
වාහන ණය	2,802,201	4,363,107
කාර්ය මණ්ඩලය සඳහා ණය	235,490	323,330
පරිගණක ණය	1,181,000	1,662,500
	50,317,302	**55,324,092**

19 බාහිර පාර්ශ්වයන් තුළ තැන්පතු	රු. 2020	රු. 2019
වෙනත් බාහිර තැන්පතු	67,707	117,707
ඉන්ධන සඳහා තැන්පතු	150,000	150,000
පුවත්පත් සඳහා තැන්පතු	4,000	4,000
ආපසු ගෙවනු ලබන තැන්පතුව - නෙළුම් පොකුණ	-	150,000
	221,707	**421,707**

20 ආයෝජන	රු. 2020	රු. 2019
ශ්‍රී සුවරිත ශිෂ්‍යත්ව අරමුදල	148,000	148,000
ආචාර්ය රන්ජන් අබේසිංහ ශිෂ්‍යත්ව අරමුදල	31,188	31,188
ස්ටීවන් හැන්සන් ශිෂ්‍යත්ව අරමුදල	14,810	14,810
ඩී.කේ. සුබසිංහ ශිෂ්‍යත්ව අරමුදල	30,000	30,000
කමලා ජයතිලක ශිෂ්‍යත්ව අරමුදල	45,000	45,000
ආනන්ද ජයසිංහ ශිෂ්‍යත්ව අරමුදල	30,000	30,000
උපකුලපති අරමුදල	128,968	116,156
බැදුම්කර හා ගිවිසුම් උල්ලංඝණ අරමුදල	2,342,572	1,939,447
මහගමසේකර ශිෂ්‍යත්ව අරමුදල	300,000	300,000
මහාචාර්ය සුගුණසිරි ශිෂ්‍යත්ව අරමුදල	100,000	100,000
සුනිල් ශාන්ත ශිෂ්‍යත්ව අරමුදල	500,000	500,000
තාවකාලික ආයෝජනය - කෝට්ටෙගොඩ	2,677,008	2,449,820
	6,347,545	**5,704,421**

21 සිදුකෙරෙමින් ඇති ප්‍රාග්ධන කාර්ය	රු. 2020	රු. 2019
ඇල්බට් ක්‍රෙස්න්ට් අධ්‍යයනාංශ ව්‍යාපෘතිය	238,606,590	-
හෝටන් පෙදෙස නව ගොඩනැගිල්ල	392,135,786	136,519,777
දෙහිවල නේවාසිකාගාර ව්‍යාපෘතිය (11) සිදුකෙරෙමින් ඇති කාර්ය	-	14,997,343
පොදු පහසුකම් - ඇල්බට් චන්ද්‍රවංක ව්‍යාපෘතිය	-	206,521,035
රාජගිරිය නව නේවාසිකාගාර ව්‍යාපෘතිය	-	12,622,130
සංවෘත පරිපථ රූපවාහිනී/අයි.පී. දුරකථන/අයි.පී. කැමරා	6,705,974	13,735,603
සිදුකෙරෙමින් ඇති කාර්ය - දෘශ්‍ය කලා පීඨයේ අභ්‍යන්තර සන්නිවේදන පද්ධතිය	746,928	-
සිදුකෙරෙමින් ඇති කාර්ය - හෝටන් පෙදෙස තොරතුරු තාක්ෂණ විද්‍යාගාර කේන්ද්‍රීක ජාලය	1,514,926	-
	639,710,204	**384,395,889**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

22 උපචිත වියදම්	රු. 2020	රු. 2019
ගිවිසුම්ගත සේවා	32,903,225	44,056,757
සුළු අළුත්වැඩියා හා නඩත්තු	-	212,378
වෙනත් පුනරාවර්තන වියදම්	1,250,690	4,529,267
පුද්ගල පඩිනඩි - අධ්‍යයන	1,098,535	2,293,399
පුද්ගල පඩිනඩි - අනධ්‍යයන	235,345	1,043,164
සැපයුම්	100,000	63,351
ගමන් වියදම්	-	33,200
විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය උපචිත වියදම	-	293,281
ණයහිමියෝ - තොග මිලට ගැනීම්	1,118,317	3,751,817
පර්යේෂණ පරිසංවාදය	-	34,250
උපචිත වියදම් - දෙසැම්බර් වැටුප	-	2,721,432
	36,706,111	**59,032,296**

23 වෙනත් ගෙවිය යුතු දේ	රු. 2020	රු. 2019
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ණය	2,785	2,785
මුද්දර බදු	45,593	55,468
මහපොල	19,304,350	19,304,350
නොගෙවූ ගෙවීම්	640,159	788,119
විවිධ ණයහිමියෝ (කාර්යාල බැගය)	-	350
ගෙවිය යුතු මහපොල ශිෂ්‍යත්ව ගිණුම	-	1,000,000
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු මුදල	2,073	1,493
ගෙවිය යුතු උත්සව අත්තිකාරම්	-	3,750
ගෙවිය යුතු විශේෂ අත්තිකාරම	-	2,400
රක්ෂණය සඳහා ගෙවීම	22,526	23,317
ණය හිමි සැපයුම්	1,938,197	14,125,999
ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු	35,664	441,959
අවලංගු කරන ලද චෙක්පත් සඳහා විවිධ ණයහිමියෝ	305,082	566,606
ගෙවිය යුතු කොන්ත්‍රාත්කරු	8,967,828	13,735,603
පර්යේෂණ පරිසංවාදය	1,101,643	1,219,946
ගෙවිය යුතු - කෝට්ටෙගොඩගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	2,677,008	2,449,820
	35,042,907	**53,721,965**

24 පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය	රු. 2020	රු. 2019
වර්ෂය ආරම්භයේදී ශේෂය	165,079,572	51,791,006
වර්ෂය තුළ කරන ලද ගෙවීම්	(21,395,367)	(9,454,244)
වර්ෂය සඳහා කරන ලද ප්‍රතිපාදනය	108,211,505	122,742,809
ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය	**251,895,710**	**165,079,572**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

		රු.	රු.
25	**තැන්පතු හා රඳවාගැනීම්**		
		2020	**2019**
	වෙනත් තැන්පතු	215,744	706,359
	ටෙන්ඩර් තැන්පතු	32,500	89,400
	රැඳවුම් ගිණුම (පුනරාවර්තන)	853,870	2,041,180
	රැඳවුම් ගිණුම (ප්‍රාග්ධන)	82,038,813	84,977,579
	ආපන ශාලා හා ඇප තැන්පතු	55,400	95,400
	කලාගාර තැන්පතුව (ජේ.ඩී.ඒ. පෙරේරා කලාගාරය)	245,000	235,000
	පුස්තකාල තැන්පතු - පශ්චාත් උපාධි පීඨය	138,500	138,500
	විවෘත හා දුරස්ථඅධ්‍යයන කේන්ද්‍රය - පුස්තකාල තැන්පතු	56,000	56,000
	නර්තන ශාලා තැන්පතුව	-	50,000
	ආපසු ගෙවිය යුතු තැන්පතුව - නයින් හාට්ස්	50,000	50,000
	රඳවා ගැනීම - පාරිතෝෂික ගෙවීම	357,915	-
	ඇප තැන්පතු අරමුදලින් මුදා හැරීම / විදේශ ගමන්	594,418	-
		84,638,159	**88,439,418**

		2020	**2019**
26	**විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය**		
	ආරම්භක ශේෂය	1,677,240	1,264,680
	අඩු කලා - 2020 වර්ෂයේ ගෙවීම	(2,185,050)	(1,087,440)
	2020 වර්ෂය සඳහා ප්‍රතිපාදනය	1,822,400	1,500,000
		1,314,590	**1,677,240**

27	**විශේෂිත අරමුදල් (සීමාකෘත)**	**2020**	**2019**
	ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම්	2,660,601	2,257,477
	ශ්‍රී සුවරිත ශිෂ්‍යත්ව අරමුදල	229,146	249,919
	එස්. හැන්සන් ශිෂ්‍යත්ව අරමුදල	20,565	23,992
	ඩී.කේ. සුබසිංහ ශිෂ්‍යත්ව අරමුදල	96,836	98,991
	රන්ජන් අබේසිංහ සහ මයිකල් ඒමිස් ශිෂ්‍යත්ව අරමුදල	72,197	69,852
	කමලා ජයතිලක ශිෂ්‍යත්ව අරමුදල	85,139	86,897
	ආනන්ද ජයසිංහ ශිෂ්‍යත්ව අරමුදල	80,895	78,986
	උපකුලපති අරමුදල	5,452,488	4,386,912
	සුනිල් ශාන්ත ශිෂ්‍යත්ව අරමුදල	574,795	531,072
	ඒකක අරමුදල (සී.ඩී.එස්. කුලතිලක පර්යේෂණ)	40,000	40,000
	සුභසාධක අරමුදල	4,222,592	3,584,810
	පීඨ සංවර්ධන අරමුදල (නර්තන හා නෘත්‍ය කලා)	1,288,502	1,249,180
	පීඨ සංවර්ධන අරමුදල (සංගීත)	363,510	360,630
	පීඨ සංවර්ධන අරමුදල (දෘශ්‍ය කලා)	970,144	804,719
	පීඨ සංවර්ධන අරමුදල (පශ්චාත් උපාධි)	771,271	652,519
	පර්යේෂණ අරමුදල (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)	-	297,616
	මහාචාර්ය සුගුණසිරි ශිෂ්‍යත්ව අරමුදල	130,610	121,684
	මහගමසේකර ශිෂ්‍යත්ව අරමුදල	335,642	308,862
	උපයන ආදායම් අරමුදල	6,861,485	2,476,750
		24,256,419	**17,680,868**

28 වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන

රු.

			1	2	3	4	5	6
		ව්‍යාපෘතිය	2020-01-01 දිනට ශේෂය	2020 වර්ෂය සඳහා රජයේ ප්‍රදාන	වෙනත් ප්‍රදාන / ආදායම්	එකතුව (1+2+3)	වර්ෂය සඳහා වියදම්	2020-12-31 දිනට ශේෂය (4-5)
112001	1	ගෘහ භාණ්ඩ, විද්‍යාගාරය හා උපකරණ සඳහා රජයේ ප්‍රදාන	(14,107,383)	16,425,000		2,317,617	2,298,063	19,553
112005	2	කාර්යාලීය උපකරණ සඳහා රජයේ ප්‍රදාන	90,350	9,375,000	-	9,465,350	9,578,476	(113,126)
112003	3	නව ගොඩනැගිලි සඳහා රජයේ ප්‍රදාන	(75,918,358)	196,650,000	-	120,731,642	278,341,834	(157,610,192)
112006	4	පුස්තකාල ග්‍රන්ථ හා වාර සඟරා සඳහා රජයේ ප්‍රදාන	(2,419,559)	2,900,000	-	480,441	472,108	8,333
112002	5	ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා රජයේ ප්‍රදාන	(16,477,988)	30,750,000	-	14,272,012	15,093,894	(821,882)
112007	6	ක්‍රීඩා භාණ්ඩ සඳහා රජයේ ප්‍රදාන	9,415	50,000	-	59,415	47,850	11,565
112008	7	පී.එච්.ඩී./ද්විතීයික උපාධි/එම්.ෆිල් ව්‍යාපෘතිය / මානව ප්‍රාග්ධන සංවර්ධනය	67,805	600,000	-	667,805	666,975	830
112004	8	ජාත්‍යන්තර පරිසංවාද, පර්යේෂණ හා ප්‍රකාශන	215,676	250,000	-	465,676	435,500	30,176
112009	10	උපාධි ලෝගු සහ ඇඳුම් ආයිත්තම්	140,400	-	-	140,400	-	140,400
113004	11	විෂය බාහිර ක්‍රියාකාරකම් දිරිගැන්වීම සඳහා වූ ප්‍රදාන	403,500	-	-	403,500	-	403,500
			(107,996,142)	**257,000,000**	**-**	**149,003,858**	**306,934,700**	**(157,930,843)**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

29 ප්‍රත්‍යාගණන සංචිතය

	2020	2019
	රු.	රු.
ප්‍රත්‍යාගණන අතිරික්තය	2,121,757,473	2,121,757,473
ප්‍රත්‍යාගණන අතිරික්තය මෝටර් රථ	27,400,000	27,400,000
	2,149,157,473	**2,149,157,473**

30 පරිත්‍යාග

	2020	2019
පරිත්‍යාග (IRQUE ව්‍යාපෘතිය)	14,166,175	14,166,175
පරිත්‍යාග (HETC)	66,296,273	66,296,273
පරිත්‍යාග (පුස්තකාල ග්‍රන්ථ)	232,450	232,450
පරිත්‍යාග (උපාධි ලෝගු සහ ඇඟළුම්)	380,000	-
	81,074,898	**80,694,898**

31 විලම්බිත ආදායම

	2020	2019
විලම්බිත ආදායම	3,214,708	3,273,788
	3,214,708	**3,273,788**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/E/UVPA/1/20/06 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 මැයි 1 දින

උපකුලපති

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර,

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 **වෙනත් කරුණු**

(අ) විවිධ කාර්යයන් සඳහා 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අවස්ථා 68කදී විශ්විද්‍යාලයේ තැන්පත් කළ එකතුව රු.46,190,585ක් වූ තැන්පතු හා රඳවා ගැනීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.1,022,650,000 ක් වූ ඉඩම් කැබලි 03 ක් නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු අවසන්කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 621 දෙනෙකු වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 433 දෙනෙකු වූයෙන් කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 172 ක් විය. පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබීම හේතුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 21,292,083 ක දීමනා ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
கட்புல ஆற்றுகைக் கலைகள் பல்கலைக்கழகம்
UNIVERSITY OF THE VISUAL & PERFORMING ARTS
21, Albert Crescent, Colombo 07, Sri Lanka
Tel. : +94 112 033 710 Fax : +94 112 696 972
E-mail : info@vpa.ac.lk Web. : www.vpa.ac.lk

INTERNAL AUDIT UNIT
21, Albert Crescent, Colombo 07, Sri Lanka
Tel. : +94 112 026 785 / 6
Fax : +94 112 696 972
E-mail : auditor@vpa.ac.lk

මගේ අංකය : ඔබේ අංකය : දිනය :

My No : UVPA/IA/NAO/2020 Your No. : HED/E/UVPA/1/20/06 Date : 2021.07.06

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2021 මැයි මස 31 වන දිනැති වාර්තාව හා බැඳේ.

යථොක්ත වාර්තාවේ සඳහන් එක් එක් කරුණ සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් පහත දැක්වේ.

2.3 වෙනත් කරුණු

(අ) මෙම රඳවා ගැනීම් සම්බන්ධ තොරතුරු ලබාගෙන 2020 ගිණුම් වර්ෂයේදී සැලකිය යුතු ප්‍රමාණයක් නිරවුල් කර ඇත. ඉතිරි ප්‍රමාණය 2021 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලය දැනටමත් පියවර ගෙන ඇති අතර කෙසේවෙතත්, විශ්වවිද්‍යාලයේ පාලනයෙන් තොර වෙනත් ආයතනික හේතූන් මත අත්පත් කර ගැනීමේ කාර්යය අවසන් කර ගත නොහැකි වී ඇත. මේ හේතුව මත ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය අවසන් වන තුරු එහි ප්‍රගතිය විගණන කමිටුවේ න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස අවධානය යොමු කිරීමට පියවර ගෙන ඇති අතර එහි වර්තමාන ප්‍රගතිය **ඇමුණුම - 01** මගින් දක්වා ඇත.

(ඇ) 2020 දෙසැම්බර් මස 31 වන දිනට හා 2021 මැයි මස 01 වන දිනට කාර්ය මණ්ඩල විස්තරය **ඇමුණුම - 02** මගින් දක්වා ඇත.

පුරප්පාඩු වූ තනතුරු අතරින් අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ තනතුරු **09** ක් සඳහාද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වූ තනතුරු **14** ක් සඳහාද අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් සිදු කර ඇත. කෙසේවෙතත්, 2020 වර්ෂයේ පැවති Covid 19 වසංගත තත්වයත්, ඇතැම් බඳවා ගැනීම් සම්බන්ධයෙන් අයදුම්කරුවන් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබීමත් හා ප්‍රාථමික සේවා බාණ්ඩයට අදාළ බඳවා ගැනීම් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි තව දුරටත් නවතා තිබීමත් යනාදී විශ්වවිද්‍යාලයේ පාලනයෙන් බැහැර වූ හේතූන් මත බඳවා ගැනීමේ කාර්යය පූර්ණ වශයෙන් අවසන් කිරීමට නොහැකි වී ඇත.

ඒ අනුව, වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු නොකර, බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් රු. 21,292,083 ක වැයක් සමාලෝචිත වර්ෂයේ දරා ඇත යන්න නිවැරදි නොවන නිරීක්ෂණයකි.

තවද, සෞන්දර්ය කලාව වෙනුවෙන් වෙන්වූ මෙම විශ්වවිද්‍යාලයේ පීඨ ත්‍රිත්වයේම විද්‍යාර්ථයින් වෙනුවෙන් අතිරේක විෂයන් (Elective Subject) සැලකිය යුතු ප්‍රමාණයක් පවතින අතර, එම විෂයන් විද්‍යාර්ථයින් විසින් සිය අධ්‍යයන අවශ්‍යතාව මත තෝරාගනු ලබයි. ඒ අනුව එම විෂයන් සඳහා පූර්ණ කාලීන ස්ථිර දේශකවරයෙකුට වෙන් කිරීමට තරම් ප්‍රමාණවත් දේශන සම්භාර ප්‍රමාණයක් නොමැතිවීමත්, මෙම විෂයන් පවතින සුවිශේෂීතාව මත බොහෝවිට එම විෂයන්හි ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහභාගි කරවා ඉගැන්වීම් කටයුතු සිදු කිරීමත්, Covid 19 වසංගත තත්වය මත 2020 මැයි මාසයේ සිට තාවකාලික කථිකාචාර්යවරුන් බඳවා නොගැනීමත් හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ වැඩි දායකත්වයක් ලබා ගැනීමට විශ්වවිද්‍යාලයට සිදුව ඇත. කෙසේවෙතත්, පෙර වර්ෂයට සාපේක්ෂව බාහිර කථිකාචාර්යවරුන්ගේ ගෙවීම් වෙනුවෙන් දරා ඇති වියදම රු. 22,767,261 කින් එනම්, 52% කින් අඩු කර ගැනීමට විශ්වවිද්‍යාලය සමත් වී ඇත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රෝහණ පී. මහලියනආරච්චි
උපකුලපති